# 'පොළ' අපේ ජන සම්ප්‍රදායේම කොටසක්

**මිනිසාට අවශ්‍ය හැම දෙයක් ම නිපදවා ගන්න ඔහුට පුළුවන්කමක් නැහැ. මේ නිසා ඔහු එකතු කරගත් හෝ නිපදවා ගත් භාණ්ඩ ඔහුට අවශ්‍ය වෙනත් දේවල්වලට හුවමාරු කර ගත්තා. පසුව මේ හුවමාරුව පහසු කර ගැනීමට පොදු මාධ්‍යයක් හැටියට යි ඔහු මුදල් භාවිතාව පටන් ගත්තේ. මේ හුවමාරු සිදු කරන මධ්‍යස්ථානත් ඉබේම වාගේ ජන සමාජයට ආවා. මින් එක් මධ්‍යස්ථානයක් තමයි පොළ.**

රටක් වැඩෙන්නට නම් රට තුළ වෙළඳාම් කටයුතු පුළුල් වෙන්නට ඕනේ. ඒ කාරණා දෙකම එකිනෙකට බැඳිලයි තියෙන්නේ. පොළවල් බොහොමයක් ආරම්භ උනේ සුළු ගොවියා තම ගෙවත්තේ නිපදවන බෝග විකුණල මිළ මුදල් සොයා ගන්න මධ්‍යස්ථානයක් හැටියට පාරිභෝගිකයන් ගේ මෙන් ම වෙළඳුන් ගේ අනුග්‍රහය ඇතිව ශ්‍රී ලංකාව පුරාම දූන් පොළවල් විසිරී පවතිනවා. පොළවල්වල සියළු කටයුතු දිහා බලනකොට ඒවා යේ සංකීර්ණත්වය අනිත් වෙළඳ මධ්‍යස්ථානවල දක්නට නොලැබෙන තරම් තරහකාරී ස්වභාවයක් දක්නට තිබෙනවා. මෙසේ නිදහස් තරහකාරීත්වය සඳහා වඩාත් නිශ්චිත වාතාවරණයක් මෙකී ස්ථානයන්හි පවතින අතර, පාරිභෝගිකයාටත් නිපදවන්නාටත් යන දෙපක්ෂයට ම එකසේ වැඩිවාසි සැලසෙන ස්ථානයක් හැටියට පොළ ගැන සඳහන් කරන්නට පුළුවන්. මේ නිසා ජනතාව ගේ ඕනෑඑපාකම් පිරිමැසීමට ජනතාව අතර බිහි වූ පොළ, ජන සම්ප්‍රදයට අයත් වූ එකක් හැටියට යයි කීම නිවැරදිය.

කලකට ඉහත දී කල සොයා බැලීමකට අනුව දිවයිනේ 'පොළ වල්' විසිරී තිබුනේ මෙසේ යි.

කොළඹ 77, කළුතර 16, මහනුවර 15, මාතලේ 08, නුවරඑළිය 12, ගාල්ල 22, මාතර 25, හම්බන්තොට 10, කුරුණෑගල 34, පුත්තලම 29, අනුරාධපුරය 11, පොළොන්නරුව 02, බදුල්ල 06, මොණරාගල 15, රත්නපුර 20, කෑගල්ල 29, යාපනය 17, ත්‍රිකුණාමලය 02, මඩකලපුව 04, අම්පාර 02. මන්නාරම හා වවුනියාවේ පොලවල්පැවැත් වුනේ නැත. මුළු ගණන 346.

දූන් රටේ පොළවල් සංඛ්‍යාව 500 ඉක්මවා ඇතැයි කීමට හැකි ය.

**1975 දෙසැම්බර් 'ගොවිජනතාව' කලාපයට කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය ගැන ලිපියක් ලියූ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ගොවි නිෂ්පාදන අලෙවි ය පිළිබඳ පර්යේෂණ නිලධාරියකු මෙසේ පවසා තිබෙනවා. 'ගොවි නිෂ්පාදන අලෙවි කිරීම කුමන ආයතනයක් මගින් හෝ විසින් කෙරුනත් ඉතා අවශ්‍ය එමෙන් ම වැදගත් වූක් දෙයක් වන්නේ එම ද්‍රව්‍ය සඳහා ගොවීනට ඉහළ ම සාධාරණ මිළක් ලබා දීමත් පාරිභෝගිකයාට එම ද්‍රව්‍ය සාධාරණ මිළ ගණන්වලට සැපයීමත්ය.' ඇත්ත වශයෙන් ම පොළක මූලික පරමාර්ථය මෙය විය යුතු යි.**

ශ්‍රී ලංකාව පුරාම විසිරී තිබෙන එක් එක් කාල වකවානු අනුව පැවැත් වෙන පොළ වල් සමාජ ආර්ථික වශයෙන් රටට ඇති කරන බලපෑම පිළිබඳ විවිධ වෙනස්කම් දක්වනවා. මෙවන් තත්වයක් ඇති විට රට පුරා ඇති පොළවල තත්වය මැනීමට එක් මිණුම් දණ්ඩක් සොයා ගැනීමට වෙහෙසීම නිෂ්පල ය. ඒ නිසා ප්‍රධාන පොළ රටාවන් පිළිබඳ විස්තරයක් ඔබ ඉදිරියේ තැබීමෙන් රට පුරා ඇති පොළවල වැදගත්කම පිළිබඳ සැහෙන අවබෝධයක් ලබා දිය හැකි යයි අප විශ්වාස කරනවා. රටේ සියළු ම පළාත් වල ජනගහණය, පරිවහණ පහසුකම්, සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ පරම්පරාගත සිරිත් විරිත්, කෘෂි කාර්මික ඉඩම් භාවිතය සහ අනෙකුත් තරහකාරී අලෙවි මාර්ගයන් ගේ බලපෑම යනාදිය ඒකරාශිවීමේ විවිධ තත්ව

යන් අනුව ඒ ප්‍රධාන රටාවන් බිහි වී තිබෙනවා.

ශ්‍රී ලංකාවේ ඉතාම අඩු වශයෙන් ජන ගහණයක් ඇති මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්කවල ග්‍රාමීය ජනතාව වාසය කරන්නේ විසිරී ඇති, නැතිනම් එකිනෙකින් බොහෝ සෙයින් ඈත් වූ ගම්මානවල ය. ඔවුන් ගේ සමාජ සම්බන්ධතාවයන්ට ඒ ගම්මාන අතර ඇති දුර බාධාවක් වීම නිසා කාල පරිච්ඡේදයන්ට අනුකූලව සමාජ ඒකාබද්ධතාවය හුවා දක්වන කේන්ද්‍රිය ස්ථානයක් වන පොළවල් පැවැත්වීමට තරම් සමාජ සංසන්ධියක් සිදු වී නැත. මෙම දිස්ත්‍රික්ක දෙකේ ගොවීන් ප්‍රධාන වශයෙන් වගා කරන්නේ වී සහ රනිල බෝග යි. ඒ නිසා ඔවුන් ගේ නිෂ්පාදන, විශේෂයෙන් වී සහ උඳු කෙලින්ම වී අලෙවි මණ්ඩලයට අලෙවි කරනවා. මෙය තවත් හේතුවක් විය හැකියි.

අනික් අතට මේ දිස්ත්‍රික්කවලට දුරින් රටේ අනිත් පැත්තේ එතරම් ජනගහණයක් නොමැති ඌව ප්‍රදේශයේ මීට වඩා වෙනස් තත්වයකියි පවතින්නේ. වවුනියාව, මන්නාරම වැනි පළාත්වල මෙන් ම මෙම ප්‍රදේශයේ ගොවීන් ද ජීවත් වන්නේ හේන් ගොවිතැන් කරමිනි. නමුත් වෙනසකට තිබෙන්නේ මේ පළාතේ ගොවීන් ඉතා අඩුවෙන් වී නිෂ්පාදනය කිරීමත්, වැඩියෙන් අනෙකුත් බෝග සහ එළවළු වර්ග ඒ හේන්වල වගා කිරීමත්. මේ බෝග බොහෝ විට වෙළඳ පොලේ අලෙවි කිරීමේ අදහසිනුයි නිපදවන්නේ. ඒ හේතු වන් මේ පළාත් හරහා වැටී ඇති මහා මාර්ග දිගේ සාමාන්‍යයෙන් සැතපුම් විස්සෙන් විස්සට සතිපතා පොළවල් පැවැත්වීම දක්නට ලැබෙනවා. මේ පොළවල්වලට ගොවීන් පැමිණීමට ඇති මාර්ග පහසුකම් යනාදිය ඉතාම අඩු වුනත් ඔවුන් ගේ ආර්ථික පැවැත්මට පොළවල් ඉතාම වැදගත් වෙනවා.

පිටරට යැවීම සඳහා තේ, රබර් නිෂ්පාදනය කරන තෙත් කලාපයේ කඳුකර ප්‍රදේශවල පැවැත් වෙන සති පතා පොළවල් එතරම් විශාල වූ ඒවා නොවෙයි. වතුවලට මැදි වූ පටු නිම්න වල පිහිටි ගම්මානවල ගොවීන් ඔවුන් ගේ කුඩා ඉඩම් කැබලි වල නිපදවෙන දේවල් පොළවල අලෙවි කිරීමට ඉදිරිපත් කෙරෙනවා. මේ පොළවල් කෙළින් ම පාරිභෝගිකයාටයි අලෙවි කරන්නේ. නිෂ්පාදකයින් සුළු ප්‍රමාණයක් වීම නිසා මේ පොළවල්වල බොහෝ විට දක්නට ලැබෙන්නේ පිට පළාත්වලින් ගෙන එන දේවල් ඒවාහි අලෙවි කෙරෙන බවයි.

**ලංකාවේ අළුතින් පිහිටුවා ඇති ගල්ඔය, වලවේ බඳු විශාල ජනපද ව්‍යාපාරවල පොළවල් පිළිබඳ තත්වය ගැන සලකන විට ඉතා පුළුල් අන්දමේ පොළවල් මේ පළාත් වල පැවැත්වීමට තුඩු දෙන තරම් සමාජ ඒකාබද්ධතාවයක් තවමත් බොහෝ දුරට දියුණු විය යුතුව තිබෙනවා. මේ හේතුවෙන් දැනට පැවැත් වෙන පොළවල් ඉතා සුළු පරිමාණයේ ඒවා යි.**

බටහිර වෙරළබඩ ප්‍රදේශයන්හි ගොවිපලවල්, කුඹුරු සහ පොල් වගා අතර විසිරී ගොස් තිබෙනවා. මේ පළාත්වල සාමාන්‍යයෙන් නිතර පැවැත්වෙන පොළවල් රාශියක් දක්නට පුළුවන්. සාමාන්‍යයෙන් විසිදහසේ සිට විසිහත් දහස දක්වා වූ ජන කොට්ඨාශයකට එක පොළක් බැගින් දක්නට තිබෙන අතර, මෙය සාමාන්‍ය සතුටුදායක තත්වයකැයි කිව හැකි ය. කෙසේ උනත් හොඳ පරිවහන පහසුකම් ද සැහෙන ලෙස විහිදී ගොස් තිබෙන ජනගහණයකින් ද යුතු වන නිසා තවතවත් පොළවල් මේ ප්‍රදේශවල ඇති කරවීමට ඕනෑතරම් ඉඩකඩ තිබෙනවා.

තෙත් කලාපයේ මැදරටත් බොහෝ විට උතුරු මැද හා ඌව පළාත්වල වගේ ම නිෂ්පාදනයන් ගේ පොළවල් යයි හැඳින්වන්නට පුළුවන් පොළවල් පැවැත් වෙනවා. පසුගිය ද කෑගළු දිස්ත්‍රික්කයේ බැමිණිවත්ත කෘෂිකාර්මික පලද වර්ධන කමිටු ප්‍රදේශයේ 'කෙසෙල් කැන් නිෂ්පාදනය සහ අලෙවි කිරීම' පිළිබඳ කරුණු හැදෑරූ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නිලධාරීන් කිහිප දෙනෙක් එහි පවතින අලෙවි රටාව ගැන කරුණු දැක්වීමේ දී පෞද්ගලික වෙළඳුන් ගේ කටයුතු පිළිබඳ ව එම වාර්තාවේ මෙසේ සඳහන් කර තිබෙනවා.

**සුළු පරිමාණයේ එකතු කරන්නන්.** කෙසෙල් කැන් එකතු කරන්නන් ගෙන් වැඩි දෙනා සුළු පරිමානයේ එකතු කරන් නන්. ඔවුන් සතියකට කෙසෙල් කැන් 25 සිට 40 දක්වා ප්‍රමාණයක් එකතු කරන අතර, ඒවා සාමාන්‍යයෙන් සතියකට වතාවක් ගම්පොළ, අන්නාසිගල, අලව්ව, උස්සාපිටිය, කෑගල්ල, කරදන සහ කඩුගන්නාව යන නගරවල පැවැත් වෙන පොළවල දී අලෙවි කරනවා. ඒවා මිළ දී ගන්නේත් සිල්ලර වෙළෙන්දන්, ආපන ශාලාකරුවන් යනාදි යනුයි. ටික දෙනෙක් පන්නල, මහනුවර සහ කොළඹ වෙළඳ පොලෙහි කොමිස් මුදල් යටතේ ඒවා විකුණනු ලබනවා. ආනමාළු, ඇඹුන්, කෝලිකුට්ටු සහ සුවඳැල් වගේ කෙසෙල් ඒවායේ ඇති කෙසෙල් ගෙඩි ගණන අනුව විකුණනු ලැබෙන අතර, ඇඹුල් සහ සීනි කෙසෙල් කැන් අනුවයි විකිණීම කරන්නේ. මේ එකතු කරන්නන්ට ඔවුනොවුනට අයත් සීමා ප්‍රදේශවලයි කටයුතු කරන්නේ. එක් එක්කෙනෙක් තවත් කෙනෙක් එකතු කරන ප්‍රදේශයට යන්නේ බොහොම කලාතුරකිනි. මේ ක්‍රමය මගින් ඔවුන් ගොවීන්ට කෙසෙල් කැන්වලට ගෙවන මුදල අඩු කර තබා ගැනීමට පුළුවන්කමක්ලැබෙනවා.

**විශාල පරිමාණයේ එකතු කරන්නන්.** මෙම සමීක්ෂණය කළ ප්‍රදේශයේ විශාල පරිමාණයේ එකතු කරන්නන් කිහිප දෙනෙක් සිටි අතර, ඔවුන් ඒවා තොග වෙළෙන්දන්ට පොළවල දී විකුණනවා. උදහරණයක් හැටි යට බලනවා නම් අළුත්නුවර ප්‍රදේශයේ කෙසෙල් අලෙවි කටයුතු වල පාලනය පවතින්නේ වෙළෙඳුන් තිදෙනෙකු අතයි. ඔවුන් සතියකට වතාවක් කෙසෙල් කැන් 400 සිට 500 දක්වා ප්‍රමාණයක් එකතු කර ගෙන ඒවා තොග වශයෙන් රඹුක්කන පොලේ දී සම මිළකට අලෙවි කරනවා. ගමේ ඔවුන් ගේ එකතු කරන මධ්‍යස්ථාන යක් ඇති අතර, එහි කුලිය වශයෙන් අවු රුද්දකට ඔවුන් රු. 150.00 ක් ගෙවනවා. එක කෙසෙල් තොගයක ආනමාළු, ඇඹුන්, කෝලිකුට්ටු සහ සුවඳල් යන කෙසෙල් කැන් ඇති ප්‍රමාණය වැඩි නම් ඒවාට සාමාන්‍යයෙන් වැඩි මිළක් ඔවුන් ලබා ගන්නවා. මේ වර්ගයේ කෙසෙල් සාමාන්‍යයෙන් 60% ක් පමණ තිබෙනවා නම් එක කැනකට ලැබෙන සාමාන්‍ය මිළ සතුටුදයක ය. මේ ක්‍රමයෙන් කෙසෙල් වර්ගය අනුව මිළ තීරණය වීම නිසා කෙසෙල් ගෙඩිවල තත්වය පොලේ දී මිළ කරණයේ දී එහි ස්ථායී තාවයක් ඇති වීමට හේතු වන්නේ නැහැ. ප්‍රධාන වශයෙන් කෙසෙල් කැන් මිළ දී ගන්නා වෙළඳුන් පැමිණෙන්නේ උඩරට ප්‍රදේශවලින්, කොළඹින් සහ මන්නාරමිනුයි. සාමාන්‍ය යෙන් දුර බැහැර ප්‍රදේශවලින් හා කඳු පල්ලම් ඔස්සේ කෙසෙල් කැන් ඔවුන් ගේ එකතු කරන මධ්‍යස්ථානයට ගෙන ඒමට කම්කරුවන් යොද තිබෙනවා. එක් කැනකට ඒ සඳහා ගෙවන මුදල රු.1.00කි.

ගොවිපල නිෂ්පාදන පොළවලට පරිවහනය කිරීම ගොවීන් වෙළෙඳුන් කොයි කාටත් ලොකු ප්‍රශ්නයක්. කඳු පල්ලම් ඔස්සේ නැති නම් කැලෑ පාරවලයි මේවා ගෙන එන්නේ. කෑගල්ලේ කලින් සඳහන් කළ බැමිණිවත්ත ප්‍රදේශයේ තත්වය ආශ්‍රයෙන් මේ දිහා ටිකක් බලමු. මෙහි වෙළෙඳුන් ඔවුන් ගේ කෙසෙල් කැන් පොළවලට සහ වෙළඳ පොළට ගෙන එන්නේ ලොරි මගිනුයි. පරිවහණ ගණන් එක මට්ටමක නොපවතින අතර, පොළවල තත්වය අනුව ඒවා ඉහළ පහළ යනවා. උදහරණයක් හැටියට කෙහෙල්පන්නල සිට සැතපුම් හයක් පමණ දුර ඇති ගම්පලට කෙසෙල් කැනක් ගෙන යාමට එක සැත පුමකට වැය වන මුදල ශත 08 සිට 13 දක්වා වෙනවා. අනෙක් අතට අළුත්නුවර සිට සැතපුම් 16 ක් දුරින් පිහිටි රඹුක්කනට කෙසෙල්කැනක් පරිවහනය කිරිමට වැය වන්නේ ශත 02 ක් පමණ යි. ඊට හේතුව ගම්පලට යාමට තිබෙන මාර්ගය ඉතා දුෂ්කර එකක් වීමයි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ ඉතාමත් එළදයි පොළ රටාවක් දක්නට තිබෙන්නේ උතුරුකරයේ යාපනය දිස්ත්‍රික්කයේ යැයි සඳහන් කරන්නට පුළුවන්. සතිපතා පමණක් නොව ඇතැම් විට දිනපතා පැය කීපයක් පැවැත්වෙන පොළවල් පවා මේ ප්‍රදේශයේ දක්නට තිබීමෙන් ඒවායේ ක්‍රියාකාරකම්වල තියුණු බව කදිමට පෙන්වනවා.